00151

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන - 2012

මුල් ළමාවියේ අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික සාධක - ESC2217

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.01.27 වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද ද දෙවන කොටසේ ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. කාර්මික විප්ලවයට පෙර සමාජය විසින් ළමයින්ට සලකන ලද්දේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

02. වෛද්‍ය මාරියා මොන්ටිසෝරි මැතිණිය "ළමා හඬ" ලෙස සලකනු ලබන්නේ කුමක් නිසාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. මුල් ළමාවියේ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ රූසෝගේ ස්වභාවවාදී ප්‍රවේශය පැහැදිලි කරන්න.

04. ද්විතියික සමාජානුයෝජක කාරක හතරක් (04) නම් කරන්න.

05. පෙර පාසලේ වයස අවු 4-5 අතර ළමයින්ට පැවරිය හැකි වගකීම් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. ශ්‍රී ලංකාවේ කේවල දෙමාපිය පවුල් සංඛ්‍යාව වර්ධනය වීමට බලපෑ හැකි ප්‍රධාන හේතු පහක් (05) දක්වන්න.

07. රූපවාහිනිය නැරඹීම මුල් ළමා වියේ පසුවන ළමයා කෙරෙහි ඇති කරවන නිෂේධාත්මක බලපෑම් පහක් (05) ක් නම් කරන්න.

08. ළමයා හා මව අතර මූලික සම්බන්ධතා පිළිබඳ ජෝන් බෝල්බිගේ සොයාගැනීම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. (i) 'පවුල' යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) විස්තෘත පවුල හා න්‍යෂ්ටික පවුල යන සංකල්ප විස්තර කරන්න. (ලකුණු 05)

(iii) පෙර පාසල් වියේ ළමයින්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පවුලේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. "පෙර පාසල් දරුවාගේ සුවදායි චිත්තවේගීය සංවර්ධනය සඳහා සමවයස් අන්තර් සම්බන්ධතා අත්‍යවශ්‍ය වේ."

(i) නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) පෙර පාසල් ළමයින් අතර සමවයස් කණ්ඩායම් අන්තර් සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියකට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

11. (i) "අවාසිදායක දරුවන්" යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) 'හානිපූරක අධ්‍යාපන වැඩසටහන්' මගින් එක්සත් රාජධානියේ අවාසිදායක ළමයින්ගේ අධ්‍යාපනික ගැටලු විසඳීමට ගෙන ඇති පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඔබ අවාසිදායක ළමුන් පැමිණෙන පෙර පාසලක ගුරුවරියක නම් එම දරුවන්ට සහායවීම සඳහා ඔබ භාවිත කරන ක්‍රමෝපායන් මොනවා ද? (ලකුණු 12)

12. "පොත්පත් කියවීමට වඩා රූපවාහිනිය නැරඹීමට ළමයි වැඩි කැමැත්තක් දක්වති."

(i) තම දරුවන්ගේ කියවීමේ රුචිය නංවාලීමට දෙමාපියන්ට ගත හැකි පියවර මොනවා ද? (ලකුණු 10)

(ii) පෙර පාසල් ගුරුවරියක ලෙස ඔබේ පෙර පාසල් දරුවන්ගේ කියවීමේ හැකියාව වැඩිදියුණු කිරීමට ඔබට කළ හැකි දේ පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. පහත දැක්වෙන මාතෘකා දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

(i) පෙරී පෙර පාසල් ව්‍යාපෘතිය
(ii) ශ්‍රී ලාංකික මව්වරුන් විදේශගතවීම බාලවියේ දරුවන් කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම
(iii) පෙර පාසල් වියේ දරුවන් රැක බලාගැනීමේ දී රැකියාවල නියුතු ශ්‍රී ලාංකික මව්වරුන් මුහුණ දෙන ගැටලු

(ලකුණු 10 x 2 = 20)

-හිමිකම් ඇවිරිණි. -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME**

**FINAL EXAMINATION – 2012**

**ESC2217 - SOCIO-CULTURAL PERSPECTIVES EARLY CHILDHOOD EDUCATION**

**DURATION : THREE (03) HOURS**

**DATE : 27th January 2013** **TIME : 9.30 a.m. – 12.30 p.m.**

**ANSWER ALL QUESTIONS IN PART I AND THREE QUESTION IN PART II**

**PART – I**

01. Describe in brief, how children were treated prior to the Industrial Revolution.

02. Explain briefly why Dr. Maria Montessori is considered as the 'Voice of Children'.

03. Explain Rousseau's 'Naturalistic Approach' on teaching methods in early childhood.

04. Name four secondary socialization agents.

05. List five (05) responsibilities that can be assigned to pre-school children from age 4-5 years.

06. State five (05) main reasons that would affect in increasing of the number of single parent families in Sri Lanka.

07. Name five (05) ill effects of watching television on children during Early Childhood period.

08. Explain briefly the findings of John Bowlby regarding child's basic relationships with the mother.

(5x8=40 marks)

## PART – II

09. i. Define the term family.

(03 marks)

ii. Describe the concepts extended family and nuclear family.

(05 marks)

iii. Explain the role of the family in the process of socializing the pre-school child.

(12 marks)

10. i. "Peer interactions are essential for healthy emotional development of the pre-school child". Explain with examples.

(08 marks)

ii. Describe three activities that a pre-school teacher could organize to promote peer group interaction among pre-school children.

(12 marks)

11. i. Explain the term "disadvantaged children"

(03 marks)

ii. Explain briefly how United Kingdom has taken remedies to solve educational problems of disadvantaged children by using Compensatory Education Projects.

(05 marks)

iii. If you are a teacher in a pre-school where disadvantaged children attend, what are the strategies you would use to support these children.

(12 marks)

12. "Children prefer watching television to reading books"

i. What are the steps that parents could take towards their children to develop interest in reading books?

(10 marks)

ii. Explain what you should do as a pre-school teacher to develop reading abilities of pre-school children.

(10 marks)

13. Write notes on any two (02) of the following:

i. Perry pre-school Project.

ii. Ill effects of migration of the Sri-Lanka mothers on young children.

iii. Problems faced by Sri Lankan working mothers when rearing their young children.

(10x2=20 marks)

*- Copyrights reserved -*